දෙසතියක ඇරඹුම

2017 .09.25 - 2017.10.08

අධ්‍යාපන අමාත්‍යාංශයේ එක් එක් ශාඛා මඟින් පැවැත්වීමට නියමිත උත්සව හා විශේෂ වැඩසටහන්

## ප්‍රතිපත්ති හා සැලසුම් අංශය

### සැප්තැම්බර් 26

පිරුණු හැකියාවක් දිනන රැකියාවක් යන තේමාව යටතේ වෘත්තික ප්‍රවේශය සඳහා වූ දහතුන් වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩපිළිවෙලේ නියාමන වැඩසටහනේ පළමු අදියර සඳහා විදුහල්පතිවරුන් දැනුවත් කිරීම.

රජයේ අධ්‍යාපන ප්‍රතිපත්තිය අනුව සෑම දරුවෙකුටම 13 වසරක අධ්‍යාපනය සහතික කරමින් වැඩ ලෝකයට නිපුණතා සපිරි පුරවැසියකු බිහිකිරීමේ අරමුණින් දියත් කර ඇති මෙම වැඩසටහනෙහි නියාමක පළමු අදියර ඔක්තෝබර් මස 02 දින ආරම්භ කිරීමට නියමිතය. ඒ සඳහා තෝරා ගත් පාසල් 42 ක් සඳහා ආරම්භ කිරීමට අවශ්‍ය චක්‍රලේඛය හා උපදෙස් ලබා දීමේ විදුහල්පති රැස්වීමක් මෙදින පැවැත්වේ. මෙම වැඩසටහන තුලින් වෘත්තීය විෂයන් 26ක් හඳුන්වා දෙමින් අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් පසුව නිර්බාධකව ඕනෑම ශිෂ්‍යයෙකුට ඉන් විෂයන් 3ක් තෝරාගෙන මූලික ඉගෙනුමක් සහිතව ප්‍රායෝගික පුහුණුවක් ලබා ගත හැකි වේ. මීට අමතරව පොදු විෂය මාලාවක් තුලින් වෘත්තීන්ට අවශ්‍ය මූලික පදනමක් ද ලබාදීමට සැලසුම් කර ඇත.

### සැප්තැම්බර් 28

මධ්‍යකාලීන සැලසුම සකස් කිරීමේ වැඩමුළුව ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පැවැත්වේ. අධ්‍යාපනයේ ජාතික අරමුණු කරා ලඟාවිය හැකි පරිදි මධ්‍යකාලීන අයවැය රාමුවට අනුකූලව මධ්‍යකාලීන සැලැස්ම සකස් කිරීම. අධ්‍යාපන ලේකම්, අධ්‍යාපන රාජ්‍ය ලේකම්, සියලුම අතිරේක ලේකම්වරු, අධ්‍යක්ෂ ජනරාල් ජාතික අධ්‍යාපන ආයතනය, විභාග කොමසාරිස් ජනරාල්, ප්‍රධාන කොමසාරිස්, ගුරු අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් සියලුම අධ්‍යාපන අධ්‍යක්ෂවරු හා මාණ්ඩලික නිලධාරීන් මේ සඳහා සහභාගි වනු ඇත.

## නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව

### සැප්තැම්බර් 25 සහ 26

ශ්‍රව්‍ය දෘශ්‍ය ආබාධිත සිසුන්ගේ ගණිත සාධන මට්ටම ඉහළ නැංවීමේ අරමුණින් සැකසූ මොඩියුලයන් ශ්‍රව්‍ය දෘශ්‍ය ආබාධිත සිසුන් සඳහා යෝග්‍ය පරිදි සැකසීමේ දෙදිනක වැඩසටහනක් ජාතික මට්ටමින් යන්ත්‍රෝපකරණ පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේදී පැවැත්වේ.

## අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන අංශය

## සෞඛ්‍ය හා පෝෂණ ශාඛාව

### ඔක්තෝබර් 2

"සුරක්ෂා" සිසු රක්ෂණාවරණය එළි දැක්වීමේ සමාරම්භක උත්සවය පෙ.ව. 9.00 සිට පෙ.ව. 10.30 දක්වා අරලියගහ මන්දිරයේදී පැවැත්වේ.

"සදා සුරකිමු දැයේ දරුවන් " තේමාව යටතේ සියලුම ශ්‍රී ලාංකීය පාසල් සිසුන්ට, එනම්, රජයේ පාසල්, ආධාර ලබන හෝ නොලබන පෞද්ගලික පාසල්, පිරිවෙන්, උපකෘත විශේෂ පාසල් සහ ජාත්‍යන්තර පාසල් යන පාසල් වල අධ්‍යාපනයේ නිරත වන වයස අවුරුදු 5 - 19 අතර වයස් සීමාවේ පසුවන සියලුම ශ්‍රී ලාංකීය සිසුන්ට ලබාදීමට නියමිත වේ.




## නැණස ඒකකය

### සැප්තැම්බර් 27 සහ 28

ටැබ් පරිගණක ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ 12 ශ්‍රේණියේ විෂයානුබද්ධ මෘදුකාංග නිර්මාණ (දෙමළ මාධ්‍ය) වැඩසටහන සහ වෙබ් යෙදවුම් නිර්මාණය සම්බන්ධ ධාරිතා සංවර්ධන වැඩසටහන නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානයේදී පැවැත්වේ.



### සැප්තැම්බර් 25, 26, සහ 27

ටැබ් පරිගණක ලබාදීමේ ව්‍යාපෘතියට සමාන්තරව අදාල පරිගණකය සමඟ ලබාදීමට (අ.පො.ස/උ.පෙළ) පෙරදිග සංගීත විෂය සඳහා 12 ශ්‍රේණියේ විෂය නිර්දේශයට අදාල පාඩම් මෘදුකාංග සකස් කිරීමේ වැඩමුළුව නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානයේදී පැවැත්වේ.

### සැප්තැම්බර් 25 සිට නොවැම්බර් 30 දක්වා

නැණස වැඩසටහන සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව සමඟ එක්ව සංවිධානය කරනු ලබන (අ.පො.ස/සා.පෙළ) ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නැංවීමේ වැඩසටහන් මාලාව දිවයිනේ පාසල් පද්ධතිය තුල පැවැත්වේ.

## ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

**ඔක්තෝබර් 7 සහ 8**

සමස්ථ ලංකා ජාතික සිංහල භාෂා හා සාහිත්‍ය වාචික තරගාවලියක් කොළඹ ආනන්ද විද්‍යාලයේදී පැවැත්වේ. මෙම වැඩසටහන සඳහා පාසල් සිසුන්, සම්පත් දායක ප්‍රවීණයින්, මාණ්ඩලික නිලධාරීන් හා ගුරු උපදේශකවරුන් මේ සඳහා සහභාගි වනු ඇත.



## අධ්‍යාපන සේවා ආයතනය

**සැප්තැම්බර් 26**

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 111 පන්තියේ සීමිත තරග විභාග ප්‍රතිඵල මත පත්වීම් ලබාදීමේ ජාතික උත්සවය ගරු අධ්‍යාපන ඇමති අකිල විරාජ් කාරියවසම් මැතිතුමා සහ ගරු අධ්‍යාපන රාජ්‍ය ඇමති වී. රාධක්‍රිෂ්ණන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 8.00 සිට පෙ.ව. 10.30 දක්වා බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වේ.

## ආගමික හා සාරධර්ම අධ්‍යාපන ශාඛාව

**සැප්තැම්බර් 30**

සිසු දරුවන් - දෙමාපියන් අතරත් සිසුන් - ගුරුවරුන් අතරත් සාරධර්ම ප්‍රවර්ධනය කිරීම සඳහා මාපිය සම්භාවනා වැඩසටහන කොලොන්නාව බාලිකා මහා විද්‍යාලයේදී විටියල කවිධජ ස්වාමීන් වහන්සේගේ මූලිකත්වයෙන් පැවැත්වේ.

## අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන අංශය - ගණිත ශාඛාව

**සැප්තැම්බර් 25, 26 සහ 27**

ගණිත ක්‍රියාකාරකම් පාදක කර ගනිමින් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රචලිත කිරීම සඳහා සම්පත් දායකයින් බලගැන්වීමේ
වැඩසටහන - 2017 (මධ්‍යම පළාත)

ශිෂ්‍ය ක්‍රියාකාරකම් තුලින්ම ගණිත සංකල්ප සරලව තහවුරු වන පරිදි ගණිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිසුන් තුල ජනප්‍රිය කරලීම මෙම වැඩසටහනෙහි අරමුණ වේ. නේවාසික දින 3ක වැඩමුළුව නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානයේදී පැවැත්වේ.



**සැප්තැම්බර් 25 සහ 26**

විවිධ ඉගෙනුම් ක්‍රමවේදයන් පිළිබඳව ගුරුවරුන් සවිබලගැන්වීම හා සිසුන්ට ගණිතය ප්‍රියජනක විෂයක් බවට පත් කිරීම යන අරමුණින් යුතුව " Working Mathematically "නියමු වැඩසටහන ජාතික මට්ටමින් පැවැත්වේ. මෙම වැඩසටහන නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානයේදී පැවැත්වෙන අතර නේවාසික දින 2ක වැඩමුළුවකි. මේ සඳහා ආචාර්ය උපාලි මාම්පිටිය, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්, කථිකාචාර්ය වරුන්, අධ්‍යාපන විද්‍යාපීඨ හා ගුරු අධ්‍යාපන පරිපාලන ප්‍රධාන කොමසාරිස්තුමා ඇතුළු මාණ්ඩලික නිලධාරීන් රැසක් සහභාගි වනු ඇත.

## අන්තර් ජාතික ගණිත හා විද්‍යා ඔලිම්පියාඩ් තරගාවලිය - 2017

**සැප්තැම්බර් 25, 26, 27, 28 සහ 29**

ජාතික මට්ටමේ ජයග්‍රහණය කළ සිසුන් අන්තර් ජාතික ඔලිම්පියාඩ් තරගාවලිය ගණිත අංශයෙන් නියෝජනය කිරීම සඳහා පූර්ව සූදානම් කිරීම මෙහි අරමුණ වන අතර නේවාසික දින 5ක වැඩමුළුව අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමණාකරන පුහුණු ආයතනයේදී පැවැත්වේ.



**සැප්තැම්බර් 28, 29 සහ 30**

ලාෆ් හෝල්ඩින් ව්‍යාපාරය සහයෝගිත්වයෙන් පවත්වනු ලබන ගණිත කඳවුර

ගණිත සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා සිසුන් කඩිනමින් සූදානම් කරවීම මෙහි අරමුණ වන අතර නේවාසික දින 3ක් ඇල්පිටිය මිරිස්වත්ත මහා විද්‍යාලයේදී පැවැත්වේ.

## ඉංග්‍රීසි හා විදේශ භාෂා ශාඛාව

**සැප්තැම්බර් 30, ඔක්තෝබර් 1, 7 සහ 8**

2017 සමස්ථ ලංකා ඉංග්‍රීසි භාෂා හා නාට්‍ය තරඟ ජාතික මට්ටමින් පැවැත්වේ. දරුවන්ගේ කුසලතා වර්ධනය කිරීම හා අගය කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ.

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව

**සැප්තැම්බර් 26 සහ 27**

පාසල තුල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සංස්කෘතියක් බිහි කිරීමේ අරමුණින් වැඩසටහනක් බලපිටිය ගුරු විද්‍යාලයේදී හා මාතර ඉල්මා මධ්‍ය මහා විද්‍යාලයේදී පැවැත්වේ.

## අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන අංශය විද්‍යා ශාඛාව

**සැප්තැම්බර් 26**

ජාතික ගණිත හා විද්‍යා ඔලිම්පියාඩ් තරඟයේ ජාතික ත්‍යාග ප්‍රධානෝත්සවය ගරු අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මැතිතුමාගේ සහ ගරු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය වී. රාධක්‍රිෂ්ණන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප.ව. 2.00 සිට ප.ව. 4.00 දක්වා අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන රැස්වීම් ශාලාවේදී පැවැත්වෙන අතර ජාතික ගණිත හා විද්‍යා ඔලිම්පියාඩ් තරඟකරුවන් ඇගයීම මෙහි ප්‍රධාන අරමුණ වේ.

## විෂය සමගාමී මාර්ගෝපදේශ හා උපදේශන

**සැප්තැම්බර් 25, 26, සහ 27**

මානසික ප්‍රථමාධාර පිළිබඳ ජාතික මට්ටමේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් මාලඹේ ප්‍රජා මධ්‍යස්ථානයේදී පැවැත්වේ.

පාසල් තුල හා ඉන් පරිබාහිරව සිදුවන බෙදාවාචකයන් නිසා සිසුන්ට බලපාන මානසික බිඳ වැටීම් සඳහා කඩිනමින් ප්‍රථමාධාර ලබාදීම වෙනුවෙන් පුහුණුව ලත් ජාතික පුහුණුකරුවන් බිහි කිරීම මෙහි අරමුණ වේ

සැකැසුම - සංඛ්‍යාලේඛන අංශය